(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **163**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 මැයි මස 03 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු  අනුර දිසානායක මහතා

ගරු  විමලවීර දිසානායක මහතා

ගරු  වීරකුමාර දිසානායක මහතා

ගරු  ඩග්ලස් දේවානන්ද මහතා

ගරු  මොහොමඩ් නවවි මහතා

ගරු  වාසුදේව නානායක්කාර මහතා

ගරු  ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු  බුද්ධික පතිරණ මහතා

ගරු  (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු  කේ. කේ. පියදාස මහතා

ගරු  සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු  සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු  අශෝක ප්‍රියන්ත මහතා

ගරු  හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු  එස්. ප්‍රේමරත්න මහතා

ගරු  බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු  තාරක බාලසූරිය මහතා

ගරු  විජිත බේරුගොඩ මහතා

ගරු  මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු  කේ. කාදර් මස්තාන් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  තිලක් මාරපන මහතා

ගරු  (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු  එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු  සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු  බිමල් රත්නායක මහතා

ගරු  සී. බී. රත්නායක මහතා

ගරු  ලොහාන් රත්වත්තේ මහතා

ගරු  ප්‍රසන්න රණතුංග මහතා

ගරු  ප්‍රසන්න රණවීර මහතා

**ගරු රොෂාන් රණසිංහ මහතා**

**ගරු මුජිබුර් රහුමාන් මහතා**

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**

**ගරු අංගජන් රාමනාදන් මහතා**

**ගරු විදුර වික්‍රමනායක මහතා**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂාන් විතානගේ මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු එස්. වියාළේන්දිරන් මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා**

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"උතුරු පළාත් සංචාරක අධිකාරිය ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අදහස් විමසමින් උතුරු පළාත් සභාවෙන් දැනුම් දීමක් ලැබී ඇති බව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 46අ (3) (අ) ප්‍රකාරව නිවේදනය කරනු කැමැත්තෙමි.

මෙම දැනුම්දීම ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරනු ලැබේ."

**II**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද "විදේශ විනිමය" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් කරන ලද නිවැරදි කිරීම් වලට යටත්ව පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි මම නියෝග කරමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකතුමා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XIV හා XV කොටස්, හතරවැනි කාණ්ඩයේ XII කොටස සහ හයවැනි කාණ්ඩයේ XVI, XVII, XVIII, XIX, XX, XXI, XXII, XXIII, XXIV හා XXV කොටස්;

(ii) 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VI, VII, VIII, IX, X, XI හා XII කොටස්, හතරවැනි කාණ්ඩයේ XI හා XII කොටස් සහ පස්වැනි කාණ්ඩයේ IX කොටස; සහ

(iii) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ V හා VI කොටස්, දෙවැනි කාණ්ඩයේ VIII, IX, X හා XI කොටස්, හතරවැනි කාණ්ඩයේ VI කොටස සහ පස්වැනි කාණ්ඩයේ II කොටස

පිළිගන්වන ලදී.

එකී යන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයිද මුද්‍රණය කළ යුතුයැයිද නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2017 අංක 2 දරන පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 42 වගන්තිය යටතේ සහ එකී පනතේ 25(2) සහ 29(2) වගන්ති සමඟ කියවිය යුතු 42 වගන්තිය යටතේ සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2017 මාර්තු 07 දිනැති අංක 2009/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග සෞඛ්‍ය හා මානව සුභසාධනය,

සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 2014 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2013 සහ 2014 වර්ෂ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු තිලක් මාරපන මහතා වෙනුවෙන් එහි සාමාජික ගරු එඩ්වඩ් ගුණසේකර මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත", "2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තා හා ගිණුම්", "2014 වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව", "2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව", "2014 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව", "2014 සහ 2015 වර්ෂ සඳහා ලංකා බැංකුවේ වාර්ෂික වාර්තා", "2014 සහ 2015 වර්ෂ සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තා" "2014 සහ 2015 වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තා", සහ "2014 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව" සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු විජිත හේරත් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද "2013 වර්ෂය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "2013 සහ 2014 වර්ෂ සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා", "2014 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව", "2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "2013 වර්ෂය සඳහා පොල් පර්යේෂණ

මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "2013 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව", "2015 වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව", "2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, තලවාකැලේ වාර්ෂික වාර්තාව", "2014 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව", "2013 සහ 2014 වර්ෂ සඳහා රබර් පර්යේෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා", "2014 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව" සහ "2013/2014 වර්ෂය සඳහා කලුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) අධ්‍යාපන සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු වඩිවේල් සුරේෂ් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද "2014 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව", "2015 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව", "2013 සහ 2014 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තා", "2013 සහ 2014 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තා", "2013 සහ 2014 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තා", "2013 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව", "2012, 2013 සහ 2014 වර්ෂ සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය**,** ශ්‍රී ලංකාව වාර්ෂික වාර්තා සහ ගිණුම්", "2013 සහ 2014 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව වාර්ෂික වාර්තා", "2013 වර්ෂය සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය වාර්ෂික වාර්තාව" සහ "2013 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) (i) මතුගම, ඕවිටිගල, "සෙවන" යන ලිපිනයෙහි පදිංචි දයාරත්න නැහින්න මහතාගෙන් ලැබුණු 2016.07.11 දිනැති පෙත්සම; සහ

(ii) කුරුණෑගල, මල්කඩුවාව, ඉසුරු පෙදෙස, අලකොලදෙනිය පාර, අංක 47 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. පී. බී. වන්නිනායක මහතාගෙන් ලැබුණු 2017.01.25 දිනැති පෙත්සම

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) රාගම, රාගම මහ රෝහලේ සේවය කළ ඒ. ජී. එස්. සිල්වා මහතාගෙන් ලැබුණු 2017.01.26 දිනැති පෙත්සම;

(ii) මහනුවර, අනගාරික ධර්මපාල මාවත, අංක 146/2 දරන ස්ථානයෙහි පදිංචි චානක අයිලප්පෙරුම මහතාගෙන් ලැබුණු 2017.03.22 දිනැති පෙත්සම;

(iii) කොළඹ 07, බාන්ස් පෙදෙස, මරීනා ඇවනිව්, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි කමලා (රණවීර) වඩුගොඩපිටිය මහත්මියගෙන් ලැබුණු 2017.03.10 දිනැති පෙත්සම;

(iv) රාජගිරිය, නාවල පාර, අංක 595 දරන ස්ථානයෙහි පදිංචි එන්. සී. කෝරලේ මහතාගෙන් ලැබුණු 2017.03.17 දිනැති පෙත්සම; සහ

(v) පිළියන්දල, නාම්පමුණුව, නිසල පෙදෙස, අංක 118/4 දරන ස්ථානයෙහි පදිංචි ටී. ඩබ්ලිව්. එම්. සංජීව දිසානායක මහතාගෙන් ලැබුණු 2017.03.21 දිනැති පෙත්සම

ගරු සුජීව සේනසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) පොළොන්නරුව, පැලටියාව, අංක 520 දරන ස්ථානයෙහි පදිංචි එච්. ජී. සෝමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු 2017.02.17 දිනැති පෙත්සම ගරු වසන්ත සේනානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) අගලවත්ත, කැකුලන්දල, කළවැල්ලාව පාර, අංක 192 දරන ස්ථානයෙහි පදිංචි චන්ද්‍රා මාලනී සූරියආරච්චි මහත්මියගෙන් ලැබුණු 2017.03.20 දිනැති පෙත්සම;

(ii) හොරණ, මිල්ලෑව, අංක 253/බී දරන ස්ථානයෙහි පදිංචි එච්. ජී. පී. ගුණසේකර මහතාගෙන් ලැබුණු 2017.03.07 දිනැති පෙත්සම;

(iii) කළුතර, නාගොඩ, 5 වන පටුමඟ, අංක 47 දරන ස්ථානයෙහි පදිංචි හේමසිරි මාපලගමගේ මහතාගෙන් ලැබුණු 2017.03.15 දිනැති පෙත්සම;

(iv) කළුතර දකුණ, ඇටවිල පාර, නිම්තෙර අසපුව, අංක 180 දරන ස්ථානයෙහි පදිංචි එම්. එච්. රසින් මහතාගෙන් ලැබුණු 2017.02.26 දිනැති පෙත්සම;

(v) පානදුර, කෙසෙල්වත්ත, තොටවත්ත, ඊබ්‍රහම් පාර, අංක 27/ඩී දරන ස්ථානයෙහි පදිංචි මොහොමඩ් නවුෆ් මහතාගෙන් ලැබුණු 2017.02.15 දිනැති පෙත්සම;

(vi) වාද්දුව, මැලෑගම, වත්තේ හන්දිය, අංක 37/2 දරන ස්ථානයෙහි පදිංචි යූ. ඩී. ඩී. විමලාවතී මහත්මියගෙන් ලැබුණු 2017.02.11 දිනැති පෙත්සම; සහ

(vii) හල්කඳවිල, මිල්ගස්උඩුල්ල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ජී. පියදාස මහතාගෙන් ලැබුණු 2017.03.20 දිනැති පෙත්සම

ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(5) බද්දේගම, පනාපගෙවත්ත, "ශාන්ති" යන ලිපිනයෙහි පදිංචි එල්. එන්. වර්ක්ස් මහතාගෙන් ලැබුණු 2016.10.22 දිනැති පෙත්සම ගරු මනූෂ නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(6) කාර්තිව්, දෙවන කලාපය යන ලිපිනයෙහි පදිංචි කේ. කදිරවේපුල්ලේ මහතාගෙන් ලැබුණු 2016.12.19 දිනැති පෙත්සම ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(7) තල්දෙන, ගොන්කටුතැන්න, "දේශානි" යන ලිපිනයෙහි පදිංචි ඩී. එම්. පියදාස මහතාගෙන් ලැබුණු 2017.01.13 දිනැති පෙත්සම ගරු තේනුක විදානගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(8) වැළඩ, පල්ලේගම, අංක 174 දරන ස්ථානයෙහි පදිංචි ඊ. එම්. තිලකරත්න මහතාගෙන් ලැබුණු 2017.03.18 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) :** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවෙන් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇතැම් නියමවලින් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් නිදහස් කිරීම සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2017 මැයි මස 23 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයිද, එය මුද්‍රණය කළ යුතුයැයිද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු එඩ්වඩ් ගුණසේකර මහතා, ගරු ලකී ජයවර්ධන මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"පිළිකා සරණ භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 21 දිනැති අංක 1994/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අ. භා. 2.47 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.37 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.00 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 5.55 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ

විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 09 දිනැති අංක 1996/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 20 දිනැති අංක 1998/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජනවාරි 06 දිනැති අංක 2000/85 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජනවාරි 18 දිනැති අංක 2002/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජනවාරි 27 දිනැති අංක 2003/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 16 දිනැති අංක 2006/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017

පෙබරවාරි 23 දිනැති අංක 2007/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 9) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 26 දිනැති අංක 2007/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 10) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 07 දිනැති අංක 2009/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**17. රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 1) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.
(2016 දෙසැම්බර් 02 දිනැති අංක 1995/37දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**18. රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 2) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2017.04.04 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.
(2017 ජනවාරි 06 දිනැති අංක 2000/86 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**19. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සංශෝධනය කරමින් 2016 දෙසැම්බර් 27 දිනැති අංක 1999/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**20. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 27 දිනැති අංක 1999/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

සංශෝධනය කරමින් 2017 ජනවාරි 03 දිනැති අංක 2000/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**21. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජනවාරි 03 දිනැති අංක 2000/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සංශෝධනය කරමින් 2017 ජනවාරි 25 දිනැති අංක 2003/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**22. වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3 වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 නොවැම්බර් 11 දිනැති අංක 1992/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**23. ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය''යි මුදල් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය''යි මුදල් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වන වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''මෝටර් වාහන තොග ආනයනය කිරීම''

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තියේ සිට 7 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

4 වැනි අලුත් වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 4 වැනි පිටුවේ 33 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"**ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. 2015 අංක 13 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (උ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(උ) ශ්‍රී ලංකා මහ බැංකුව 2017 මාර්තු මස 31 වන දිනට පෙරාතුව; සහ".".

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"4 වැනි අලුත් වගන්තිය, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය හා නාමය**

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය"යි මුදල් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**24. කල් තැබීම (කැළණි ගඟේ ජල දූෂණය වැළැක්වීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 6.33 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.04 ට, 2017 අප්‍රේල් මස 06 වන දින සභා සම්මතිය අනුව, 2017 මැයි මස 04 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.